**වයඹ පළාත් සභාව**

**කොන්ත්‍රාත් පදනමින් සිවිල් ඉංජිනේරු නිලධාරීන් බඳවා ගැනීම**

වයඹ පළාතේ කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව, වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සහ වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන ආයතන සතු ගොඩනැගිලි, වාරිමාර්ග, මාර්ග සහ අනෙකුත් ව්‍යාපෘති සැලසුම් කිරීම, ඇස්තමේන්තු කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්:**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක එම කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු (සිවිල්) ආයතනය විසින් පිළිගනු ලැබ ඇති වසර 04ක පූර්ණ කාලීන විද්‍යාවේදී ඉංජිනේරු උපාධි පාඨමාලාවට බඳවාගනු ලබන විෂය ධාරාවක් යටතේ සාර්ථකව සම්පූර්ණ කර උපාධිය ලබා තිබීම

හෝ

උපාධි පාඨමාලාවට සමාන සුදුසු කමක් ලෙස අදාල අධ්‍යාපන හා අනිකුත් අවශ්‍යතා සම්පූර්ණ කර සිවිල් ඉංජිනේරුමය පාඨමාලාවක් හදාරා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ ඊට ඉහළ සාමාජිකත්වයක් ලබා තිබීම.

II. මහා පරිමාණ ඉදිකිරීම්, මාර්ග, වාරිමාර්ග හෝ ගොඩනැගිලි ක්ෂේත්‍රයේ ව්‍යාපෘති කළමනාකරණය සහ අධීක්ෂණය පිළිබඳ වසර දෙකකට (02) නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

III. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු 25ත් 45ත් අතර වීම.

හෝ

IV. රජයේ හෝ රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක සිවිල් ඉංජිනේරු තනතුරක සේවය කර විශ්‍රාම ලබා ඇති, වයස අවුරුදු 67 නොඉක්ම වූ ඉංජිනේරුවරුන්ටද අයදුම් කල හැකිය.

**02. සේවයේ යෙදවීමේ කොන්දේසි:**

I. කොන්ත්‍රාත් කාලය තුළ රජයේ අනුමත චක්‍රලේඛ වලට අනුව ආයතනික මට්ටමින් මාසිකව රු 101938.00 ක දීමනාවක් ගෙවනු ලැබේ.

II. විශ්‍රාමික නිලධාරීන්ට නැවත සේවයේ යොදවා ගැනීමේදී ගෙවීම් කරන විධිවිධාන අනුව බඳවාගනු ලබන විශ්‍රාමික නිලධාරීන් සඳහා ගෙවීම් කිරීම සිදු කෙරේ.

III. මෙම පත්වීම **2026.12.31** දින දක්වා පමණක් වලංගු වන අතර, තාවකාලික කොන්ත්‍රාත් පදනමක් මත බඳවාගැනීම සිදු කෙරේ.

IV. සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා දායකත්ව හිමිකම් පවතී.

V. වයඹ පළාතේ ස්ථිර පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**03. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය:**

පහත ආකෘතියේ පරිදි අයදුම්කරුවන් විසින්ම සකස් කරගන්නා ලද අයදුම්පත හා අදාල අධ්‍යාපනික සහ සේවා පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකවල ඡායාපිටපත් සමඟ **2026.06.24** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස ඉහල කෙළවරේ "**කොන්ත්‍රාත් පදනමින් ඉංජිනේරු නිලධාරීන් බඳවා ගැනීම**" යනුවෙන් පැහැදිලිව සඳහන් කර පහත ලිපිනයට යොමු කළ යුතුය.

ලිපිනය: **ප්‍රධාන ලේකම්, වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල**

**වයඹ පළාත් සභාවට කොන්ත්‍රාත් පදනමින් ඉංජිනේරු නිලධාරින්**

**බඳවා ගැනීමේ අයදුම්පත්‍රය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :.........................................................................................
2. මුලකුරු සමඟ නම :.........................................................................................
3. උපන් දිනය :.........................................................................................
4. ජාතික හැඳුනුම්පත් අංකය :.........................................................................................
5. 2026.06.24 දිනට වයස :අවු...................... මාස................ දින..........................
6. ස්ථිර ලිපිනය :.........................................................................................

   .........................................................................................

   .........................................................................................
7. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :.........................................................................................
8. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :.........................................................................................
9. විවාහක/අවිවාහක බව :.........................................................................................
10. දුරකථන අංකය ජංගම :............................................

    ස්ථාවර:............................................

    WhatsApp: ......................................
11. විද්‍යුත් තැපැල් ලිපිනය :.........................................................................................
12. අධ්‍යාපන සුදුසුකම් :.........................................................................................
13. වෘත්තීය සුදුසුකම් :.........................................................................................
14. සේවා පළපුරුද්ද :.........................................................................................
15. නිවේදනයේ සඳහන් පරිදි ඉල්ලුම් කරනු ලබන දෙපාර්තමේන්තු ප්‍රමුඛතා අනුපිළිවෙලින්

    i. .....................................

    ii. .....................................

    iii. .....................................

ඉහත සඳහන් සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

.....................................................................

අයදුම්කරුගේ අත්සන දිනය.........................................